**බීසීසී ලංකා ලිමිටඩ් - 2017/2018**

-------------------------------------------

බීසීසී ලංකා ලිමිටඩ්හි 2018 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

----------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැකසීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු.49, 304,291 ක් වූ වත්කම්වල ඵලදායී ආර්ථික ජීවකාලය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 3(ඉ) වගන්තිය ප්‍රකාරව, සමාගමේ ව්‍යාපාර කටයුතු වලින් ලද ලාභය ගණනය කිරීමේදී පොලී ආදායම වෙනම ආදායමක් ලෙස සලකා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම රු 1,393,577 කින් අඩුවෙන් දක්වා තිබූ අතර ඒ හේතුවෙන් ලාභයද එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2018 මාර්තු 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.1,420,474 ක් වූ ණයගැති ශේෂය හා රු. 4,577,421ක් වූ ණය හිමි ශේෂය සම්බන්ධයෙන් ශේෂ සනාථන හා වෙනත් අදාල සාක්ෂි නොමැතිවීම නිසා ඒවායේ නිවැරදිතාවය හා පැවැත්ම පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ඈ) වර්ෂ දොළහක සිට පැවත එන මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.58,111,396 ක් වූ පිරිවැටුම් බදු, ආරක්ෂක බදු, භාණ්ඩ හා සේවා බදු, වරිපනම් බදු සහ එකතු කල අගය මත බදු ශේෂයන් සඳහා ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවායේ නිවැරදිතාව හා විශ්වාසවන්තභාවය සනාථ කර ගැනීමට නොහැකි විය .

(ඉ) 2018 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයට රු.4,508,696 ක් ගෙවිය යුතු ලෙස දක්වා තිබුණි.කෙසේ වුවද, ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, ලැබිය යුතු ශේෂයක් දක්වා නොතිබූ අතර මෙම ශේෂයේ නිවැරදිතාවය තහවුරු කිරීම සඳහා වෙනත් විකල්ප සාක්ෂි විගණනයට ලබාදී නොතිබීම හේතුවෙන් මෙම ගෙවිය යුතු ශේෂය පිළිබඳ විගණනයේදී සැක සහිත විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 මාර්තු 31 දිනට සීමාසහිත බීසීසී ලංකා ලිමිටඩ් හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය ප්‍රකාරව, මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මාගේ විගණන මතය අනුව,

- විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු හා කරුණු පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනී යන අන්දමට සමාගම විසින් ප්‍රමාණවත් ගිණුම් වාර්තා හා පොත්පත් පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.3 නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීතිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133(1) වගන්තියේ (ඒ) සහ (බී) | ගිණුම් වර්ෂය අවසන් වී මාස 06 ක් ඇතුළත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කොටස් හිමියන් වෙත වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විය යුතු වුවත්, 2017 හා 2018 වර්ෂ සඳහා මහා සභා රැස්වීම් පවත්වා නොතිබුණි. |
| (ආ) | සමාගමේ සාංගමික සංස්ථාවලියේ 78 වගන්තිය | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සාමාජිකයන් 07 දෙනෙකුගෙන් සමන්විය යුතු වුවත් සාමාජිකයන් 05 දෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 104 | අනතුරකට ලක් වී තිබූ සමාගමට අයත් ලොරි රථයක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.86,800 ක මුදලක් වැය කර තිබූ නමුත් රු.55,800 ක් පමණක් රක්ෂණ වන්දි ලෙස ලැබී තිබූ අතර සමාගමට සිදුව තිබූ රු.31,000 ක අලාභය සම්බන්ධයෙන් වගකිවයුත්තන් නිශ්චය කරගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 110 | අලාභ හානි සම්බන්ධයෙන් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය

--------------------------------------------

| | |
|---|---|
| (i) 4.2.2.ඡේදය | සමාලෝචිත වර්ෂය තුලදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 04ක් පමණක් පවත්වා තිබූ අතර මේ හේතුවෙන් චක්‍රලේඛය ප්‍රකාරව සමාගමේ කාර්ය සාධනය මාසිකව සමාලෝචනය කර නොතිබුණි. |
| (ii) 5.2.1 ඡේදය | සමාගමේ ගිණුම් වර්ෂය 2017 අප්‍රේල් 01 දින සිට 2018 මාර්තු 31 දක්වා වූයෙන් අයවැය ලේඛනය එම කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කල යුතු වුවද 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි පිළියෙල කර තිබුණි. |
| (iii) 8.2.2 ඡේදය | අතිරික්ත මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ හා අදාළ අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගත යුතු වුවත්, එපරිදි අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.85,619,918 ක් ආයෝජනය කර තිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 මාර්ගෝපදේශය | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

--------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,471,934 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු.21,687,425 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය රු.20,215,491 කින් පිරිහී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දී වෙනත් මෙහෙයුම් ආදායම් රු.15,361,818 කින් අඩුවීම හා පරිපාලන වියදම් රු.8,108,064 කින් වැඩිවීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

| අනුපාතය | 2016/2017 | 2017/2018 |
|---|---|---|
| දළ ලාභ අනුපාතය සියයට | 8 | 4 |
| ශුද්ධ ලාභ අනුපාතය සියයට | 16 | 1 |

ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සමාගමේ දළ ලාභ අනුපාතය සියයට 4 කින් හා ශුද්ධ ලාභ අනුපාතය සියයට 15 කින් අඩුවී තිබුණි. පොල් තෙල් ගැණුම් මිල ඉහල යාම හා ඒ හා සාපේක්ෂව විකුණුම් මිල වැඩි නොවීම, සබන් අලෙවියෙන් අලාභ ඇති වීම, වෙනත් ආදායම් අඩුවීම හා පරිපාලන හා බෙදාහැරීමේ වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කළමනාකරණ ක්‍රියාකාරකම්**

බී.සී.සී. සමාගමට අයත් අක්කර 12, රූඩ 03, පර්චස් 8.77 ක් වූ භූමි ප්‍රමාණයෙන් කොළඹ අධිකරණ පියස ඉදිකිරීම සඳහා අක්කර 06 ක්ද, බන්ධනාගාර මූලස්ථානය ප්‍රතිස්ථාපනය කිරීමට පහසුකම් සලසාදීම සඳහා රිමාන්ඩ් බන්ධනාගාරය පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් අක්කර 04 ක් හා වාණිජමය කටයුත්තක් සඳහා නාගරික සංවර්ධන අධිකාරිය වෙත අක්කර 02 රූඩ 03 පර්චස් 8.77 ක් ලබාදීමට 2015 දෙසැම්බර් 17 දිනැති අංක අමප/15/1874/702/010, 2016 අප්‍රේල් 20 දිනැති අංක අමප/16/0597/731/009-1, 2016 ජූනි 21 දිනැති අංක අමප/2016/1277/724/052 දරන අමාත්‍ය මණ්ඩල පත්‍රිකා මගින් අනුමැතිය ලබා දී තිබුණි.

**4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් නිෂ්පාදන ක්‍රියාවලිය වෙනුවෙන් පෙරසැරි ගිණුම් පවත්වා නොතිබුණු බැවින් නිෂ්පාදන වර්ග 02ක් වෙනුවෙන් ඉපයූ ලාභය/අලාභය පිළිබඳව තොරතුරු හා නිෂ්පාදනයේදී සිදුවන සාමාන්‍ය හෝ අසාමාන්‍ය අපතය හඳුනාගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) ෆාම් ඔයිල් ඇසිරීමේ නව ව්‍යාපෘතියේ ඔයිල් යන්ත්‍රය ස්ථාපිත කිරීම සඳහා වූ ඉදිකිරීම් කටයුත්තක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.831,858ක් වැය කර තිබූ නමුත්, ව්‍යාපෘතිය මෙම වාර්තාවේ දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) වටිනාකම රු. 603,267 ක් වූ යල්පැන ගිය තොග කපා හැරීම සඳහා කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි.

**4.3** **හඳුනාගන්නා ලද පාඩු**

-----------------------

සමාගම විසින් 2013/2014 තක්සේරු වර්ෂය සඳහා ආදායම් බදු ගෙවීම පමා කිරීම හේතුවෙන් රු.42,139 ක දඩ මුදලක් ගෙවා තිබුණි.

**4.4** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් වසර 30 කට පමණ පෙර සිට ලංකා හෝටල් සංස්ථාවේ කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු.100,000 ක් ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා කිසිදු ලාභාංශයක් ලැබී නොතිබුණි.

(ආ) සමාගමේ භාවිතය සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයෙන් ලබා දී තිබූ වොල්වෝ රථය විගණිත දිනය වූ 2018 අගෝස්තු 02 දින වන විට අවුරුදු 02 කට ආසන්න කාලයක් භාවිතයෙන් තොරව පැවතුණි.

(ඇ) 2013 වර්ෂයේ සිට ජාතික සංවර්ධන බැංකුවෙහි පවත්වාගෙන ගිය ජංගම ගිණුමෙහි පැවති රු.1,227,921 ක ශේෂය, 2017 දෙසැම්බර් 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණය ප්‍රකාරව ජංගම ගිණුමට බැර කිරීමට කටයුතු කර නොතිබූ අතර 2014 වර්ෂයෙන් පසු මෙම ශේෂය සඳහා ශේෂ සනාථන ද ලබාගෙන නොතිබුණි.

(ඈ) 2018 පෙබරවාරි 07 දින සිට වතුපිටිවල කර්මාන්ත ශාලාවේ භාවිතය සඳහා ලබාදී තිබූ කැබ් රථය ධාවන සටහන අනුව විගණිත දිනය වූ 2018 ජූලි 31 දක්වා දින 17ක් පමණක් ධාවනයේ යොදවා තිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ජලනල පද්ධතියේ අවශ්‍යතාවයන් සඳහා 2017 මැයි මාසයේදී රු.91,048ක් වැය කර හියුම් පයිප්ප මිලදී ගෙන තිබුණු අතර, විගණන දිනය වූ 2018 ජූලි 31 වන විටත් ඒවා භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.

**4.5** **කාර්ය මණ්ඩල පරිපාලනය**

---------------------------

2006 සැප්තැම්බර් 22 දිනැති 2006 අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාරව, කාර්ය මණ්ඩලය අනුමත කර ගැනීමට හා බඳවා ගැනීමේ පරිපාටියක් සකස් කර නොතිබූ අතර ඒ හේතුවෙන් වැටුප් කාණ්ඩ පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

## 5. තිරසාර සංවර්ධනය

---------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව බීසීසී ලංකා සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

---------------------------------------

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2015 ජනවාරි 27 දිනැති අංක පීඊඩී/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව, සෑම රාජ්‍ය සමාගමක්ම මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2018 ඔක්තෝබර් 08 දින දීය.

## 7. පද්ධති හා පාලනයන්

------------------------

ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් සිදුකිරීම කෙරෙහි විශේෂ අවධානය යොමුකල යුතුය.